**ප්‍රසම්පාදන දැන්වීම**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ.**

අකුරම්බොඩ මධ්‍ය මහා විද්‍යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.

ප්‍රසම්පාදන අංකය:- DSM/ACC/10/NCB/2025/08

මෙම කාර්යාලයේ දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින්, අකුරම්බොඩ මධ්‍ය මහා විද්‍යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජාතික තරඟකාරී මිල කැඳවීමේ ක්‍රමය යටතේ ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය ලැබූ, අසාධු ලේඛනගත නොවූ, සුදුසුකම්ලත් හා නිපුණතා පූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන | ලංසු සුරක්ෂණයේ වටිනාකම රුපියල් | ලංසු සුරක්ෂණයේ වලංගු කාලය | අවම යෝග්‍යතාවය CIDA | ලංසු ලියකියවිලි ගාස්තු රුපියල් | කොන්ත්‍රාත් කාලය |
|---|---|---|---|---|---|---|
| අකුරම්බොඩ මධ්‍ය මහා විද්‍යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය. | 21.09 | 265,000.00 | 2026.01.25 දින දක්වා | C6 හෝ ඉහළ (ගොඩනැගිලි) | 5,000.00 | දින 60 |

02. ලංසු ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලංසු ලේඛන, 2025.09.17 වන දින සිට 2025.09.30 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව.08.30 සිට ප.ව.3.00 තෙක් මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත ආපසු නොගෙවන ලංසු ලියකියවිලි ගාස්තුව ගෙවා රිසිට් පතක් හා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ගිණුම් අංශයෙන් ලබා ගත හැකිය.

03. ලංසු සුරක්ෂණය “දිස්ත්‍රික් ලේකම් ,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතලේ.”නමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් ඉහත සඳහන් වටිනාකමින් යුත් 2026.01.25 දින දක්වා වලංගු ලංසු සුරක්ෂණයක් විය යුතු අතර, එසේ නොමැති නම් එම වටිනාකම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් තැම්පත් කිරීමෙන් සිදු කළ හැක.

04. ඔබ විසින් සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි (පිටපත් දෙකකින් සමන්විත), ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට 2025.10.01 දින ප.ව.02.30 දක්වා බහාලිය හැකි අතර, එදින ප.ව.02.30 ට ලංසු භාර ගැනීම අවසන් වූ සැණින් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

05.මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් හා වැඩි විස්තර ප්‍රධාන ගණකාධිකාරී දුරකථන අංක 0662222709 අමතා ලබා ගත හැකිය.

එල්.පී.මදනායක
ප්‍රසම්පාදන කමිටු සභාපති
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
මාතලේ.
2025.09.16

එල්.පී මදනායක
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මාතලේ